රජය මගින් ටයර් ආනයනයට පැනවූ සීමාවන්, ශ්‍රී ලංකාවේ රබර් සහ ටයර් කර්මාන්තයේ ඉතිහාසය සහ ටයර් ආනයනය සීමා කිරීමෙන් පසු රටේ වර්තමාන තත්වය යන කරුණු පදනම් කරගනිමින් සති අග අරුණ පුවත්පතේ පළවී තිබූ විශේෂාංග ලිපියකි. මෙම ලිපිය සම්බන්ධයෙන් අපගේ අවධානයට ලක්වූ කරුණක් වූයේ, ටයර් සමගින් නිරූපණය සඳහා පෙනී සිටිනා කාන්තාවකගේ ඡායාරූපයයි.

මෙම ඡායාරූපය බොහෝ විට ටයර් වෙළඳ දැන්වීමක් සඳහා නිර්මාණය කරනු ලැබූවක් වීමට හැක. එනමුත්, මෙම ලිපියේ අන්තර්ගතයට හෝ සන්දර්භයට මෙම ඡායාරූපයේ අදාළත්වයක් තිබේද? එසේම එවන් ඡායාරූපයක් ඔස්සේ සිදුවන්නේ කාන්තාව ලිංගික භාණ්ඩයක් ලෙසින් හැඟවුම්කරණය වීම නොවේද? මෙම ඡායාරූපය යොදාගෙන ඇත්තේ ලිපිය සඳහා ආකර්ෂණයක් ලබාගැනීමට නම්, ඒ ඔස්සේද යටකී දෙවන කරුණ තහවුරු වනවා නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස්ද දැනගැනුමට අපි කැමැත්තෙමු.

**#MediaEthicsSL #lka #SinhalaPress #SathiAgaAruna**